# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2001 අංක 4 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2001 අප්‍රේල් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 අප්‍රේල් මස 12 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. **6.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**2001 අංක 4 දරන ජාතික ආරක්ෂක බදු**
**(සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2001 අප්‍රේල් මස 11 වන දින]

එල්.ඩී.–ඕ. 11/2001.

**1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත, 2001 අංක 4 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි (මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 3 වන වගන්තියේ, (2) වන උපවගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– 1991 අංක 52 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඊඊ) සහ (ඊඊඊ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඊඊ) ශ්‍රී ලංකාවට ආනයනය කරන යම් නැවක් හෝ ගුවන් යානයක් පාවිච්චි කරනු ලබන්නේ, භාණ්ඩ හෝ මගීන් ජාත්‍යන්තරව ප්‍රවාහනය කිරීම සඳහා බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, එසේ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් නැවක හෝ ගුවන් යානයක වටිනාකම;"

(2) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයේ අ අයිතමයේ–

(අ) (viii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :–

"(viii) යම් ගොඩනැගිල්ලක්, පාරක්, පාලමක්, ජලසම්පාදන, ජලාපවහන හෝ කසළ කාණු පද්ධතියක්, වරායක්, ගුවන් තොටුපළක් ඉදිකිරීමට හෝ විදුලි සංදේශ හෝ විදුලිබල ව්‍යාපෘතියක යම් යටිතල පහසුකම් ඉදිකිරීමේ

2—H 011604 – 4,400 (2001/03)

කාර්යය සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු විසින් සපයනු ලබන, එහෙත් ඒ ඉදිකිරීම්වල කාර්ය සඳහා හෝ ඒ හා සම්බන්ධව සපයනු ලබන–

(අ) යම් ද්‍රව්‍ය, පිරියත, යන්ත්‍රසූත්‍ර හෝ උපකරණ සැපයීමේ සේවා ; හෝ

(ආ) වෘත්තීය හෝ උපදේශක සේවා

නොවන, සේවාවලින් ;'' සහ

''(ආ) එහි (xi) වන අනුජේදයේ ''නැව් නියෝජිතයකු හෝ'' යන වචන ඉවත් කොට ඒ වෙනුවට ''නැව් නියෝජිතයකු හෝ 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ සාදන ලද නියෝග යටතේ බලපත්‍රලත් ගුවන් යානා සමාගම් නියෝජිතයකු හෝ සීඝ්‍ර දූතයකු ''යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;''

(ඇ) එහි (xi) වන අනුජේදයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අනුජේද ඇතුළත් කිරීමෙන් :–

''(xiඅ) කවර හෝ වරායක සපයනු ලබන වරාය ක්‍රියාකරුවකුගේ හෝ වරාය බහලු පර්යන්ත ක්‍රියාකරුවකුගේ සේවාවලින් ;

(xiආ) මුළුමනින් ම ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රයෝජනයට ගැනීම සඳහා පරිගණක මෘදුකාංග නිර්මාණකරුවකු, තමා විසින් නිර්මාණය කරනු ලබන හා බැංකු මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන මෘදුකාංග සඳහා එකී පරිගණක මෘදුකාංග නිර්මාණකරුවකුගේ සේවා වලින් ;

(xiඇ) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සඳහා ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තන්ට භාණ්ඩ

විකිණීමට හෝ සේවා සැපයීමට හැකියාව ලබාදෙන හෝ පහසුකම් සලසන සේවා වන අනන්‍ය සේවා සැපයීම පිණිස, 2001 අප්‍රේල් මස 01 වන දින දී හෝ ඉන් පසුව පිහිටුවන ලද ව්‍යවසායක් විසින්, පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයන්ට අනුකූලව නිෂ්පාදිත මෘදුකාංග යොදාගෙන අන්තර්ජාලය ඔස්සේ සපයන සේවාවලින් ;

(xiඇ) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත, හඳුනාගත් සේවාපේක්ෂකයකුට හෝ සේවාපේක්ෂකයන් වැඩි සංඛ්‍යාවකට, අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ අනන්‍ය සේවාපේක්ෂක ආධාරක සේවා සැපයීම පිණිස 2001 අප්‍රේල් මස 01 වන දින දී හෝ ඉන්පසුව පිහිටුවන ලද ව්‍යවසායක් විසින් අන්තර්ජාලය හෝ දුරකථන ඔස්සේ සපයන සේවාපේක්ෂක ආධාරක සේවා වලින්.".

(ඇ) එහි (ඔ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :–

"(ඕ) යම් ගුවන්යානයක භාවිතය සඳහා ආනයනය කරන ගුවන්යානා ඉන්ධන වල වටිනාකම.".

**3.** 2000 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඔ) ඡේදයේ "2000 ජූලි මස 01 වන දිනයෙන් හෝ ඉන්පසුව ආරම්භවන සෑම කාර්තුවක් සඳහා ම" යන වචන හා ඉලක්කම් වෙනුවට, "2000 ජූලි මස 01 වන දින හෝ ඉන්පසුව එහෙත් 2001 අප්‍රේල් මස 01 වන දිනට ප්‍රථම ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා ම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ඕ) 2001 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා ම–

(i) ඒ කාර්තුවේ ප්‍රථම මාසය සඳහා, ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතහමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන මුදලක් ;

(ii) ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා, ඒ කාර්තුවේ තෙවන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතහමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව, යම් මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන මුදලක් ; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර, මේ ජේදයේ (i) වන අනුජේදයේ සහ (ii) වන අනුජේදයේ විධිවිධානවලට අනුකූලව, ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණවල එකතුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ පසු ඉතිරි මුදල.".

4. 2000 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ 11 වන අයිතමයේ "2000 ජූලි මස 01 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2000 ජූලි මස 01 වන දින හෝ එදිනට පසුව එහෙත් 2001 අප්‍රේල් මස 01 වන දිනට පෙරාතුව" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපලේඛනයේ අගට, පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :-

"(12) 2001 අප්‍රේල් මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භවන සෑම කාර්තුවක් සඳහාම :-

(i) මේ අයිතමයේ (ii) වන ජේදයේ සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත,

සියයට 7.5

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව මෝටර් කාර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන පිරිවැටුම මත

සියයට 0.5

වලංගු කිරීම.

**5.** 2001 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භවන කාලසීමාව තුළ, පිරියත, යන්ත්‍ර හෝ උපකරණ නොවන යම් භාණ්ඩයක් ආනයනය කරන ආනයනකරුවකුගෙන් ඒ භාණ්ඩයේ වටිනාකමින් සියයට හයහමාරක් ඉක්මවන එහෙත් සියයට හතහමාරක් නොඉක්මවන මුදල් ප්‍රමාණයක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කරනු ලබන අවස්ථාවක, ඒ එකතු කිරීම වලංගු ලෙස කර ඇති බවට සහ කරනු ලබන බවට, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ එකතු කිරීම සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩු පිළිබඳ වගකීමෙන්, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

අන්තර් කාලීන විධිවිධාන.

**6.** (1) මේ පනත අදාළ වන තැනැත්තකු විසින්, මේ පනතේ 3 වන සහ 4 වන වගන්ති මගින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් නියමිත පරිදි, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දිනයට පෙරාතුව යම් මාසයක් හෝ කාර්තුවක් වෙනුවෙන් යම් මුදල් ප්‍රමාණයක් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු යයි නියමිතව ඇති අවස්ථාවක, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ඔහු විසින් ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා එකී වගන්තිවල නියමයන් අනුව කටයුතු කර ඇතැයි සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ඒ මුදල් ප්‍රමාණය එසේ ගෙවනු නොලැබූ අවස්ථාවක, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දින සිට දින තිහක් ඉකුත්වීමෙන් පසුව, එම මුදල ගෙවීම පැහැර හරිනු ලැබ ඇති සේ සැලකිය යුතු අතර, ඒ තැනැත්තා, ඒ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ගෙවීම් පැහැර හැරි තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනත අදාළවන තැනැත්තකු විසින් , 2001 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භව, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාලසීමාව සම්බන්ධයෙන්, ඒ තැනැත්තාගේ ඒ කාලසීමාව සඳහා වූ පිරිවැටුමෙන් සියයට හයහමාර ඉක්මවන මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට මේ පනතේ 3 වන සහ 4 වන වගන්තිවලින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තයේ 4 වන වගන්තිය මගින් ඒ තැනැත්තාට නියමිතව ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ කාලසීමාව සඳහා ගෙවීමට මේ පනතේ 3 වන හා 4 වන වගන්තිවලින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් ඔහුට නියම කරන ලද මුදල සහ ඒ කාලසීමාව

සඳහා ඔහු විසින් ගෙවන ලද මුදල අතර වෙනස, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා, ඒ වගන්තියේ නියමයන් අනුව ක්‍රියාකර ඇතැයි සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ඒ වෙනස එසේ ගෙවා නොමැති අවස්ථාවක, මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරනු ලැබූ දින සිට දින තිහක් ඉකුත්වීමෙන් පසු, ඒ වෙනස ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ අර්ථානුකූලව ඒ තැනැත්තා ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ගෙවීම් පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

**7.** මේ පනතේ 2 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට කරන ලද සංශෝධනය -

(අ) ඒ සංශෝධනය ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) සහ (iii) ඡේද ඉවත් කිරීම හා සම්බන්ධව වන තාක් දුරට, 2001 අප්‍රේල් මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ආ) ඒ සංශෝධනය උප කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව වන තාක් දුරට, 2001 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ඇ) ඒ සංශෝධනය වරාය ක්‍රියාකරුවන් සහ වරාය බහාලූ පර්යන්ත ක්‍රියාකරුවන් සම්බන්ධව වනතාක් දුරට, 2000 පෙබරවාරි මස 15 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ඈ) ඒ සංශෝධනය පරිගණක මෘදුකාංග නිර්මාණකරුවන්, සම්බන්ධව වන තාක් දුරට, 2001 මාර්තු 8 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය ;

(ඉ) ඒ සංශෝධනය නැව් හෝ ගුවන් යානා ආනයනය සම්බන්ධව වන තාක් දුරට, 1999 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය; සහ

(ඊ) ඒ සංශෝධනය ගුවන්යානා ඉන්ධන ආනයනය කිරීම හා සම්බන්ධව වන තාක් දුරට, 2001 අප්‍රේල් මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.